# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

2018 මාර්තු මස 09 වන දින

**II** වන කොටස

**අතිරේකය**

(2018.03.09 දින නිකුත් කරන ලදී)


## දණ්ඩ නීති සංග්‍රහය (සංශෝධන)

**(19 වන අධිකාරය වූ) දණ්ඩ නීති සංග්‍රහය සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.**

අධිකරණ අමාත්‍යතුමාගේ නියමය පරිදි පළකරන ලදී.


ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැක.

මිළ : රු. 6.00 යි. තැපැල් ගාස්තුව : රු. 10.00 යි.

මෙම ගැසට් අතිරේකය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

## නීතිය බලපෑමේ ප්‍රකාශය

***2 වන වගන්තිය*** : මේ වගන්තිය මගින් (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) (19 වන අධිකාරය වූ) දණ්ඩ නීති සංග්‍රහයේ 75 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර සංශෝධිත පරිදි වගන්තියේ නීතිය බලපෑම වන්නේ, ළමයකුගේ කිසිදු ක්‍රියාවක් වරදක් නොවන්නේ කවර වයස් සීමාවකට වඩා අඩු වූ විට ද, ඒ වයස් සීමාව වැඩි කිරීම වේ.

***3 වන වගන්තිය*** : මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 76 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි වගන්තියේ නීතිය බලපෑම වන්නේ, ළමයකු විසින් කරන ලද ක්‍රියාවක ස්වභාවය හා ප්‍රතිඵලය අවබෝධ කරගැනීමට තරම් ප්‍රමාණවත් පැසුණු බුද්ධියක් ඔහුට නොමැති බව විනිශ්චයකාරවරයාගේ මතය වන්නේ නම්, ඒ ක්‍රියාව වරදක් නොවන්නේ කවර වයස් කාණ්ඩයක් තුළ දී ද, ඒ වයස් කාණ්ඩය වැඩි කිරීම වේ.

# දණ්ඩ නීති සංග්‍රහය
## (සංශෝධන)

එල්. ඩී.— ඕ. 33/2016.

**(19 වන අධිකාරය වූ) දණ්ඩ නීති සංග්‍රහය සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

ලුහුඬු නාමය.

**1.** මේ පනත 2018 අංක දරන දණ්ඩ නීති සංග්‍රහය (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

19 වන අධිකාරයේ 75 වන වගන්තිය සංශෝධනය කිරීම.

**2.** (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) (19 වන අධිකාරය වූ) දණ්ඩ නීති සංග්‍රහයේ 75 වන වගනතිය–

(1) ඒ වගන්තියේ "අවුරුදු අටකට" යන වචන වෙනුවට "අවුරුදු දෙළහකට" යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(2) ඒ වගන්තියේ පැති සටහනෙහි "අවුරුදු අටෙන්" යන වචන වෙනුවට "අවුරුදු දෙළහෙන්" යන වචන ආදේශ කිරීමෙන්,

මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 76 වන වගන්තිය සංශෝධනය කිරීම.

**3.** ප්‍රධාන ප්‍රඥප්තියේ 76 වන වගන්තිය-

(1) ඒ වගන්තියේ "අවුරුදු අටකට වැඩි අවුරුදු දෙළහකට අඩු" යන වචන වෙනුවට "අවුරුදු දෙළහකට වැඩි අවුරුදු දහතරකට අඩු" යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(2) ඒ වගන්තියේ පැති සටහනෙහි "අවුරුදු අටකට වැඩි දෙළහකට අඩු" යන වචන වෙනුවට "අවුරුදු දෙළහකට වැඩි දහතරකට අඩු" යන වචන ආදේශ කිරීමෙන්,

මෙයින් සංශෝධනය කරනු ලැබේ.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**4.** මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.